සන්නස SANNASA

## ඩී.බී ගුණ සුවඳ
### ජගත් වෙත්තසිංහ

දෙස බස රැසට පළ කොට නිබදවම පෙම
මුතුහර පැළැද සැරසූ සරසවිය ළැම
සුරපුර රැගෙන සාහිත කරුවෙකුගෙ නම
ගුවනට ඇදුණි ඩී බී ගුණ සුවද දුම

පන්හිද ගැටුණු හැම දේමක් රසබරය
ඔබ බිහි කළේ මහ ලේඛක පිරිවරය
සද බැස ගිහින් අද දිනයට දෙවසරය
පාළුයි තවම මේ මෙල්බන් පුරවරය.

සිංගරැ සිරිත ලියැවී පත් ඉරැ අස්සේ
හෝචිමිංගෙ සිරගෙයි දිනපොත ඔස්සේ
අන්තිම උපන් දින සාදය දුටු පස්සේ
සංගම් කරැගෙ මළගම කළ එළි බැස්සේ

ලේඛණ කලාවට හරබර කතාවට
නෑවෙන කෙනකු සිටියේ ඒ විලාසෙට
ඔබ පා රැදුණු කස්තිරමෙහි ලතාවට
කවිරැත් නොමැත නැග ඒ වේදිකාවට

නවකාවයෙන් ලියැවුනි හැම වදනක්ම
සංවාදයට තුඩුදුනි හැම වැකියක්ම
හෙළ ලිව් සැරිය තුළ ඔබ ඇති කළ දැක්ම
අමතක නොවෙනු ඇත ජීවත් වන තෙක්ම

හෙළබස පුබුදු කොට සාහිත අමොද රසින්
ගරැ බුහුමනට පත් කළ ඔබෙ පැසුණු හිසින්
සාහිතවේදියාණනි අද සැවොම විසින්
ඔබෙ නම රැගෙන යනු ඇත අන් සැමට උසින්

ඔබ පිරිවැරැව පිරිවර ඔබෙ වියෝවෙනී
රසපත් ඉරැව ගැන විමසන නිසාවෙනී
බව සැරිසරන විට මතුදින දයාවෙනී
මහගත් කරැව යළිඑනු මැන පියාණෙනී

## කදුළු නටබුන්......
### නුවන්ගි මධුමාලි
ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය

කඳුළුනටබුන් පිරුණු දේසෙට
ඉරක් පායනවා ඇතී....
එහිරැ කිරණින් කැකුළු කුසුමන්
තවත් පුදිනවා ඇතී....

දුරක ගිය දරැ පැටව් එනතුරැ
මවක් මග බලමින් ඇතී.....
දොරකඩින් එන විහග ගී හඩ
සදහටම ගොළු වී ඇතී.. ...

වියෝගින්නෙන් දැවෙන හදවත්
ඔහේ ඉකිබිදිමින් ඇතී.....
පියාඹා ගිය අතීතය දැක
දහස් වර මියැදෙනු ඇතී...



## වෙසක් පැතුම
### ජයසේන කොඩිතුවක්කු
වත්තල-ශ්‍රී ලංකා

වදහළ පරිදි බුදු හිමි පිරිනිවි දවසේ
බැබලේ බුදු සසුන ලක්දිව අද මෙලෙසේ
සිරිලක නව වරක් සසුනට පිදුවාසේ
කැප වෙමු අපිත් රැකගන්නට රට නොලසේ

තෙරුවන් ගුණය හද තුළ අපෙ නිති රන්දා
ගුණ දම් පුරමු දහමට බැති සිත බන්දා
පෙර කළ පිනෙන් මිනිසත් බව ලද හින්දා
සසරින් ගොඩ යන්න හැකි වෙයි නැත බාදා

ආමිස පිදුම් පිං සපුරා ගන්න හොඳයි
පිළිවෙත් පුරන්නට මුල් තැන දිය යුතුමයි
කාලය කෙටියි අත ඉක්මන් කළොත් අගෙයි
නැති නම් ඉතින් සසරේ දුක තව ලියලයි

සත සිත දහම වෙත නිරතුරු සබැඳේවා
මෙත සිත පිරී බුදු බැතියෙන් පිබිදේවා
නැත ලොව කිසිත් තිර ලෙස එය වැටහේවා
අතහැර සියළු දේ නිවනට ළං වේවා

## හන්තාන සිහිනය
### ශෂිකලා නුවන්ගි
ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය

සොයා ආවෙමි සොදුරැ සිප්බිම
හන්තාන සෙවනේ....
පියාණනි ඔබ පිදූ සෙනෙහස
දරා හද මඩලේ....

දෙනෝදාහක් සිහින සොයනා
යොහොඹු කැල අතරේ.......
සොයා පියඹමි නුඹේ සිහිනය
එයයි මා සිහිනේ.......

වසී හිරිමල් පැතුම් වැහිපොද
යොවුන් සිත් අහසේ......
ඔබේ සෙනෙහස් දියෙන් නැහැවෙමි
තනිව මා රිසි සේ......

මලවි රොන්සුණු පවන කුරිරැයි
නිබද ඉන් මිදෙමි......
පියාණනි ඔබෙ සුවද පමණක්
නිහඩවම විදිමි.......

## සිරකරුවෝ මනුෂ්‍යයෝය
### ජයසේන කොඩිතුවක්කු
වත්තල ශ්‍රී ලංකා

බීගෙන ඇවිත් රෑ මවුනට පහර දෙන
වැඳ වැඳ කීව මුත් කණකටවත් නොගෙන
මගෙ පොඩි හිතට ඉවසන්නට බැරිම තැන
මට හිර ගෙදර පියාට හිමි විය සොහොන

වියපත් මව සමග මල්ලිව රැක ගන්න
තාත්තා නැති ගෙදර බර හිස මත වැටුණ
නැති තැන රැකියාව වෙසඟන විය තුටින
මා සිර ගෙදර මවුහට කාගේ සරණ

පණ වගෙ පෙමින් සිටි මුත් ඇගෙ අත ගන්න
විරසක වුනා බැරි විය මට ඉවසන්න
පෝසත් තරුණයෙකි ඇය හා පෙම් බැඳුන
මම හිර ගෙදර ඇය ගියෙ අවසන් ගමන

ඉඩමට තියෙන මගෙ අයිතිය වහන් කොට
ගැටුමට ආවෙ පාතාලයො පෙරටු කොට
මගෙ බේරුමට මම කැත්තක් වනන කොට
මරණය ඔහුට මට සිර ගේ දස වසට

මිලියන ගණන් ලොක්කා යටි මඩි ගැහුවා
එක දෙක මොණරු අපටත් ඉඳහිට ආවා
දැනගෙන හෙළි නොකල වරදට අසු වූවා
නොකළ වරදකට මම හිර බත් කනවා

තද කරගෙන හිතේ දුක අඩුවක් නැතිව
සිර ගත බොහෝ දෙන ලත වෙයි අසරණව
කර ගත් දේ නැතිව ඉවසුම ඉක්මන්ව
සිර දඬුවම් විඳින හැම වෙයි මිනිසුන්ව

## පාතිමා නංගියේ
### ජයසේන කොඩිතුවක්කු

උඹට මතකයි ද මං පාතිමා නංගියේ
අපි එකම බැච් එකේ සරසවිය කැළණියේ
පර්දාව නුඹෙ ගතට නව හැඩක් එක් කළේ
සොයුරු දම අපි ගාව නැත බිඳුනෙ කිසි දිනේ

හමු වුනේ නැතත් අපි සරසවි යුගෙන් පසු
බොඳ වෙලා නැහැ අපේ පෙර මතක සටහන්
කළු වලාවෙන් පසු පාස්කුවෙ ඉරු දිනේ
හිත මගේ වද දෙයි පවසන්න හිත මගේ

ජාතියේ ලේබලය අපි උඹල වෙන් කළත්
එකම ලේ මස් වලින් හැදුනු පංචස්කන් ද
ඉස්ලාම් දහමින් නැතිද හෙළිවෙන්නෙ
මිරිඟුවක් වුනාවත් ද කුරානය සහරාන්ට

නංගියේ උඹත් දැන් සිව් දරු මවක් නේ
අම්මලා දරුවෝ එකම ලේ විලක් මැද
මිනිස් කම නොහඳුනන මේ නරුමයන් හට
මොන දිව්‍ය ලෝකෙද දොරගුළු හැරෙන්නේ




